මෙම උපදෙස් මාලාව;

**අ**. පොදු උපදෙස්,
**ආ.** හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව සහ උපලේඛන සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් වලින් සමන්විතය.

වාර්තාව සහ උපලේඛන සම්පූර්ණ කිරීමට පෙර මෙම උපදෙස් මාලාව පරිශීලනය කරන ලෙස උපදෙස් දෙනු ලැබේ. වැඩිදුර තොරතුරු www.ird.gov.lk දේශීය ආදායම් වෙබ් ද්වාරයට පිවිසීමෙන් ලබා ගත හැකිය.

## අ. පොදු උපදෙස්

**1.** දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජන වත්කම් උපලබ්ධිවීම මගින් වන ලාභ මත වන බදු බැඳියාවට අමතරව හවුල් ව්‍යාපාරයක් තම හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායම මත ආදායම් බදු ගෙවීමට යටත් වේ.

## 2. වාර්තා නිකුත් කිරීම හා භාරදීම

### නිකුත් කිරීම

2020/2021 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීමට යටත් තැනැත්තන් වෙත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් හවුල් ව්‍යාපාර ආදායම් වාර්තාව නිකුත් කරනු ලැබේ.

මෙම වාර්තාව හා උපලේඛන ඔබගේ අභිමත භාෂාවෙන් ඔබ වෙත ලැබීමට සලස්වා ඇත. (ඉදිරියට වාර්තා හා අනෙකුත් ලිපි ලේඛන වෙනත් භාෂාවකින් අවශ්‍ය වන්නේ නම්, ඒ පිළිබඳව **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු සේවා අංශයට** දැනුම් දිය යුතුය.)

### භාරදීම

නිසි පරිදි සම්පූර්ණ කළ වාර්තාව, (වාර්තාව - හවුල් ව්‍යාපාර සහ අනිවාර්යය උපලේඛන) සහ වෙනත් අවශ්‍ය කරන ලිපිලේඛන, **2021 නොවැම්බර් 30** වන දින හෝ එදිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකට තැපැල් කිරීම හෝ අතින් ගෙනවිත් භාරදීම සිදුකළ යුතුය.

- **අත්තිකාරම් ආදායම් බදු (236 කොටුව)**

අනුයෝජිතයා විසින් අඩු කරන ලද මුළු අත්තිකාරම් ආදායම් බද්ද 236 කොටුවේ ඇතුළත් කරන්න.

- **ස්ව තක්සේරු මත ගෙවීම් (237 කොටුව)**

3(ඇ) උපලේඛනයේ 228.2 කොටුවෙහි එකතුව 4 ආ උපලේඛනයේ 237 කොටුවට ප්‍රමාණය ඇතුලත් කරන්න.

**238 වන කොටුවේ ඇති මුළු බදු බැරවල එකතුව වාර්තාවේ 110 වන කොටුවට ඇතුලත් කරන්න.**

## 5. හවුල්කරුවන් හට බදු ගෙවීම්, සුදුසුකම් ලබන ගෙවීම් සහ අත්තිකාරම් ආදායම් බද්ද බෙදා හැරීම

### 5.1 5(අ) උපලේඛනය: හවුල් ව්‍යාපාර ආදායම මත ගෙවූ ස්ව තක්සේරු ගෙවීම් සහ ප්‍රාග්ධන ලාභ බද්ද බෙදා හැරීම

**239 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් ගෙවන ලද ස්ව තක්සේරු ගෙවීම්වල සහ අවසාන ගෙවීමේ එකතුව එක් එක් හවුල්කරුවන් සඳහා බෙදා වෙන්කර ඇතුලත් කරන්න. මෙහි 239 තීරුවේ එකතුව 3 ඇ උපලේඛනයේ 228.2 කොටුවෙහි එකතුවට සමාන විය යුතුය.

**240 තීරුව:** හවුල් ව්‍යාපාරය විසින් ගෙවනු ලැබූ ප්‍රාග්ධන ලාභ බද්ද එක් එක් හවුල කරුවන් වෙත බෙදා වෙන්කර දැක්වීමට මෙම තීරුව භාවිතා කරන්න. මෙහි 240 තීරුවේ එකතුව 3 අ උපලේඛනයේ 216.5 කොටුවට සමාන විය යුතුය

### 5.2 5(ආ) උපලේඛනය: සුදුසුකම් ලබන ගෙවීම් හා අත්තිකාරම් ආදායම් බද්ද

**241 තීරුව:** හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද සමුච්චිත සුදුසුකම් ලබන ගෙවීම් හවුල් කරුවන් වෙත බෙදා වෙන් කරන්න.

**242 තීරුව:** හවුල් ව්‍යාපාර ආදායම මත අඩු කරන ලද අත්තිකාරම් ආදායම් බද්ද හවුල් කරුවන් අතර බෙදා දැක්වීමට මෙම තීරුව යොදා ගන්න. 242 තීරුවේ එකතුව 3 ආ උපලේඛනයේ 222.5 කොටුවේ අගයට සමාන විය යුතුය.



www.ird.gov.lk www.ird.gov.lk www.ird.gov.lk

## 6. 6 වන උපලේඛනය: හවුල් ව්‍යාපාර අලාභ ගැලපීම පිළිබඳ විස්තර

2020/2021 තක්සේරු වර්ෂයේ ව්‍යාපාර අලාභ, ආයෝජන අලාභ සහ නිදහස් ආදායමේ අලාභ පිළිවෙලින් කොටු 243.2, 244.2 සහ 245.2 කොටුවල පිළිවෙලින් ඇතුලත් කරන්න. 2020/2021 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ එක් එක් ආදායම් ප්‍රභවය යටතේ අඩු කළ හැකි අලාභ ප්‍රමාණය 6 වන උපලේඛනයේ ඇතුළත් කරන්න.

## 7. 7 වන උපලේඛනය: හවුල් ව්‍යාපාරයේ විස්තර

හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ ගිණුමේ විස්තර 246 සිට 253 දක්වා කොටුවල සහ ශේෂ පත්‍රයේ විස්තර 254 සිට 260 දක්වා කොටුවල ඇතුලත් කරන්න.

බදු - වඩා හොඳ අනාගතයකට
வரிகள் – வளமான எதிர்காலத்திற்காக
TAXES - FOR A BETTER FUTURE